**මහ/මහාමායා බාලිකා විදුහල**
**MAHAMAYA GIRLS' COLLEGE**

| | |
|---|---|
| දෙවන වාර පරීක්ෂණය - 2022 | **ශ්‍රේණිය - 7** |
| **සිංහල** | පැය **2** |

**විභාග අංකය / Index No** ..................................

# 1 කොටස

පහත සඳහන් ඉරි ඇඳි පදවලට සමාන අරුතක් ඇති පිළිතුර තෝරන්න.

01. ධර්ම ශාස්ත්‍රීය ප්‍රබෝධය නිසාම <u>සුපේෂල ශික්ෂාගාමිකා</u> සහ පරපුරක් මෙරට බිහිවිය.

1) ධර්මය සොයා යන
2) ධර්මය පතුරුවා හරින
3)මනා සේ හික්මුණු
4) සිතුසේ මත දරණ

02. <u>කරත්ත අඹරාවක</u> හැඩය ගන්නා පැල්පත්වල ඔවුහු සිය ජීවිකාව ගෙන ගියහ

1) කරත්ත රෝදයක
2) කරත්ත බඳ
3) කරත්තයේ වියගහ
4) කරත්තයේ වහල

03. මහා විහාරයේ පෝය ගේ වශයෙන්_ඉදිවුණු සත් මහල් ප්‍රාසාදය <u>පුවලිත</u> වූයේ ලෝවාමහාපාය නමිනි

1) දියුණු වූයේ
2) ප්‍රසිද්ධ වූයේ
3) ගරාවැටුණේ
4) බැබළවූයේ

04. දාවිත් රාලහාමි මුලින්ම <u>අත්තමට</u> පැමිණි ගොවින්ට සංග්‍රහ කළේය.

1) යහළුකමට
2) අසල්වැසිකමට
3) මුදල් සඳහා
4) උදවුවට

05. මෙරට කතෝලික සංස්කෘතිය කිතු දහමේ හා සිංහල සංස්කෘතියේ <u>සංකලනයක්</u> විය යුතු බව එඩ්මන් පීරිස් රදගුරුතුමා විශ්වාස කළේය.

1) මනා එකතුවක්
2) දියුණුවක්
3) බෙදීමක්
4) කොටසක්

02. පහත සඳහන් කියමන් හරි නම් “✓” ලකුණද වැරදි නම් “×” ලකුණද යොදන්න.

1) වචනයක අගට එක්වී අර්ථය වෙනස් කිරීමට හේතුවන භාෂා කොටස උපසර්ග ලෙස හැඳින්වේ. ( )

2) එළාර රජුගේ දීඝජන්තු යෝධයා ගැන සඳහන් වී ඇත්තේ සමනල හැල්ල නම් සාහිත්‍ය ග්‍රන්ථයේය. ( )

3) ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය අවම කිරීමට ගත යුතු ක්‍රියා මාර්ගයකි උපකරණ අලුත්වැඩියා කර නැවත භාවිතය ( )

4) අතීතයේ යකඩ නිස්සාරණය සිදුකර ඇත්තේ යකඩ අඩංගු ඛනිජයක් වන හීමටයිට් භාවිතයෙනි. ( )

5) අපේ වැවේ වී - හොඳින් වැවේවී...... ගීතය එස්. මහින්ද හිමියන් විසින් රචනා කර ඇත ( )

(ල 5)

03. පහත වාක්‍යයේ උපසර්ග පද යටින් ඉරක් අඳින්න.

අද උදේ අම්මා දුන් උපදෙස් පිළිබඳ අපමණ සතුටක් මට ඇතිවිය (ල 3)

04. පහත සඳහන් පදවලට සමාන පද යා කරන්න.

| | |
|---|---|
| 1) වෙසක් | තුලාව |
| 2) සඟල | වෛශාඛ්‍ය |
| 3) තරාදිය | යුග්මය |
| 4) දිනය | මස්ටක |
| 5) මත්ස්‍ය | දාතම |

(1 × 2 = 5)

05. පළමු රවුම තුළ ඇති පදවලට විරුද්ධ පද දෙවෙනි රවුම තුළින් තෝරන්න.

| පළමු රවුම | දෙවෙනි රවුම |
|---|---|
| සංකෝචනය | ආදීනව |
| ලෞකික | ලෝකෝත්තර |
| පුරපස | බහුල |
| විරල | අවපස |
| ආනිශංස | ප්‍රසාරණය |

(ල 5)

06. නිවැරදි අක්ෂර වින්‍යාසය තෝරන්න.

1) අර්................ස්ථ (න, ණ)
2) කණ්.............ජ (ට, ඨ)
3) මලණ්...........(ඩ,ඪ)
4) ..............හැබ (ලැ, ළැ)
5) අ.............න්පො...........(බ, භ / ල, ළ) (ල 5)

07. කවිය සම්පූර්ණ කරන්න.

කෙන්ද පොල් ඉතා - සුළු දෙයකි සැක නැතා

..........................................................................................................

.......................................................................................................... (ල 2)

මහ/මහාමායා බාලිකා විදුහල
MAHAMAYA GIRLS' COLLEGE

| | |
|---|---|
| දෙවන වාර පරීක්ෂණය - 2022 | ශ්‍රේණිය - 7 |
| **සිංහල** | |

**විභාග අංකය / Index No** .................................

## II කොටස.

01. පහත මාතෘකා අතුරෙන් එකක් තෝරාගෙන වචන 150කට නොඅඩු රචනාවක් ලියන්න. එහි **උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි** විය යුතු අතර <u>**තමාගේ රචනයේ සැකිල්ල මුලින් දක්වා**</u> පසුව රචනය ලියන්න.

i. සඳ පහන් රැයක මහ වනයක් මැද ගත කළෙමි
ii. මා සිත් ගත් ලේඛකයා
iii. අපි කසල කළමනාකරණය කරමු
iv. සිරිපා අසිරිය (සැකිල්ලට ල 5, රචනය ල 15 = 20)

02. පහත පාඩම් ආශ්‍රිත අවස්ථා සම්බන්ධය ලියන්න. (ල 3 × 5 =15)

| අවස්ථාව | පාඩම | කීවේ කවුද | කාටද |
|---|---|---|---|
| 1. තොපගෙන් කෑ තලවලට මම මිල දෙමි | | | |
| 2. මං ලොකු වුණාම ටිකට් එකතු කරන කෙනෙක් වෙනවා | | | |
| 3. ඇයි අපි එනකොට ගෙනාවෙ රතු ගඟුලනේ | | | |
| 4. බැහැ බැහැ ඔබ මා එතනට කැඳවා ගෙන ගොස් පැන දුවාවි | | | |
| 5. විසි අට කියන්නේ අනිද්දා නේද? | | | |

03. ඔබ පාසලේ ශිෂ්‍ය සුබ සාධක සංගමයේ ලේකම් ඔබ යැයි සිතා පාසලේ ශිෂ්‍යාවන්ට සහන මිලට ලිපිද්‍රව්‍ය හා පාසල් උපකරණ හා ෆොටෝ කොපි සේවාව පහසුවෙන් ලබා ගැනීම සඳහා පාසල් සමූපකාරයක් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු ඔබ පාසල තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන මෙන් ඉල්ලා විදුහල්පතිතුමිය මගින් මහනුවර කලාප අධ්‍යාපන කාර්යාලයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා වෙත ලියන රාජකාරී ලිපිය ලියන්න. (ල 15)

නැතහොත්

ඔබේ පාසලේ පැවැත්වෙන වාර්ෂික විවිධ ප්‍රසංගය නැරඹීම සඳහා දෙමාපියන් වෙත කෙරෙන ආරාධන පත්‍රය ලියන්න. ඒ සඳහා නිර්මාණශීලීව අවශ්‍ය සියලුම තොරතුරු දක්වන්න.

04. පහතින් ගීතයක කොටසක් දැක්වෙයි. එය කියවා පිළිතුරු සපයන්න.

මහසෙන් රජ වැඩ නින්දට යන්නට - ඇය දැන් සැරසෙනවා
අවුරුදු දහසක් කෙත් බිම් සරු කොට - සිනැහී සැතපෙනවා
යලත් බලා මහත් බලා - ගොයමට දිය රැළි නංවනවා
මින්නේරිය වැව හෙට ගී කියියේ - උදයට ළං වෙනවා

i. මෙයින් කියැවෙන වැව කුමක්ද?
ii. මෙය සෑදීමේදී අනුග්‍රහය දැක්වූයේ කවුද?
iii. මෙහි වී වගා කරන කන්න 2ක් ගැන කියවේ. ඒ මොනවාද?
iv. ගීතයට අනුව කොපමණ කාලයක සිට මෙම වැව සේවය සලසනවාද?
v. පහත පදවල අර්ථය ලියන්න.
   a) කෙත් -
   b) ගොයමට දිය රැළි නංවනවා -

(ල 10)

05. පහත වචන යොදා අර්ථවත් වාක්‍ය සාදන්න.

i. සරණ
ii. පහන

(2 × 2 = ල 4)

06. සුදුසු විරාම ලකුණු යොදන්න.

i. මම ඉදිරිපස පෙළට යමියි අමල් කීවේය
ii. අනේ අහිංසක හා පැටවාට සිද්ධ වුණු ඇබැද්දිය
iii. අපි පෙ.ව. 10 00 12 00 මිදුල ශුද්ධ කරමු

(ල 6)